ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන සහ

නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන - 2023/2024

හයවන මට්ටම

අවසාන පරීක්ෂණය - 2024

**STU6311- විෂයමාලා න්‍යාය හා පරිචය**

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.21 | වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01 වන කොටස

01. විෂයමාලාව පිළිබඳව පිලිගත් නිර්වචන දෙකක් (02) දක්වන්න.

02. විෂයමාලා අධ්‍යයනය ගුරුවරුන්ට වැදගත් බව පෙන්වීමට හේතු හතරක් (04) ලියන්න.

03. විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියක අඩංගු විය යුතු මූලිකාංග හතරක් (04) නම් කරන්න.

04. නිදසුන් දෙකක් (02) දක්වමින් අව්ධිමත් විෂයමාලාවක් යන්නෙන් කුමක් අදහස් වේද යන්න පැහැදිලි කරන්න.

05. විෂයමාලා කළමනාකරණයේ අවස්ථා තුනක් (03) සඳහන් කරන්න.

06. "විෂය මාලා ඇගයීම" යනුවෙන් කුමක් අදහස් වේදැයි විස්තර කරන්න.

07. පාසල් විෂයමාලා කළමනාකරණයේදී විදුහල්පතිවරයාගේ භූමිකාවේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න්න.

08. විෂය සමගාමී ක්‍රියාකාරකම් යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08 =40)

## 02 කොටස

09. (i.) ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියේ ප්‍රබලතා හා දුබලතා තුන (03) බැගින් දක්වන්න. (ලකුණු 06)

(iii.) වීලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය පැහැදිලි කර, ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියෙහි දුර්වලතා, වීලර්ගේ ආකෘතිය මගින් නිවැරදි කර ඇත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i.) විෂයමාලා සංවර්ධන ප්‍රවේශ හතර **(04)** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

(ii.) ඉහත ඔබ සඳහන් කරන ලද තෝරාගත් ප්‍රවේශ දෙකක **(02)** කැපී පෙනෙන ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(iii.) නාට්‍ය හා රංග කලාව හෝ විද්‍යාව/ ගණිතය විෂයට අදාලව ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාව සංවර්ධනය වී ඇති ආකාරය විෂයමාලා සංවර්ධන ප්‍රවේශ මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

11. (i.) විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා උදාහරණ හයක් **(06)** සපයන්න.

(ලකුණු 06)

(ii.) සිසුන්ගේ සමස්ථ සංවර්ධනය (Total Development) සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම අගයන්න.

(ලකුණු 06)

(iii.) විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සිසු සහභාගිත්වය ඉහල නැංවීම සඳහා ගතහැකි ක්‍රමෝපායන් තුනක් **(03)** පැහැදිලි කරන්න.

(ලකුණු 08)

12. (i.) විෂයමාලාවක පරමාර්ථ හා අරමුණු තීරණය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii.) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව මඟින් සිදුකල විෂයමාලා ප්‍රතිසංස්කරණ තුනක් **(03)** දක්වන්න.

(ලකුණු 06)

(iii.) විෂයමාලා අරමුණු සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලබන මූලාශ්‍ර නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

13. (i.) විෂයමාලා ඇගයීම්කරුවෙකු සතු වියයුතු ගුණාංග හයක් **(06)** නම් කරන්න.

(ලකුණු 06)

(ii.) නාට්‍ය හා රංග කලාව හෝ විද්‍යාව/ ගණිතය ගුරුවරයෙකු හට සංවිධානය කරගත හැකි ඇගයීම් ක්‍රම තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

(iii.) ඔබ පාසල් සන්දර්භය තුල ක්‍රියාත්මක කෙරෙන විෂයමාලා වැඩ සටහනක්/ අධ්‍යානයක් ඇසුරින් නිදසුන් දක්වමින් ටයිලර්ගේ අරමුණු පාදක විෂයමාලා ඇගයීම් ආකෘතියෙහි පියවර සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

14. (i.) 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු දෙකක් **(02)** සඳහන් කර ඒවා නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii.) "පාසල් විෂයමාලාව සංවර්ධනය කිරීමේදී මනෝවිද්‍යාත්මක පදනම සැලකිය යුතුයි." සුදුසු උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

- හිමිකම් ඇව්රිණි.-